**විද්‍යුත් ප්‍රකාශ/විද්‍යුත් උපදෙස්, සේවාවන් සඳහා අදාළ වන නියමයන් හා කොන්දේසි**

මා/අප සතු සමාගම/ආයතනය/ව්‍යාපාරය විසින් DFCC බැංකුව පීඑල්සී හි (මෙහි මින් ඉදිරියට "බැංකුව" යනුවෙන් හැඳින්වේ) දැන් පවත්වා ගෙන යනු ලබන හෝ මින් මතු පවත්වා ගෙන යනු ලබන යම් ගිණුමක් (ගිණුම්) සහ/හෝ බැංකුව සමග හෝ හරහා මා/අප සතු සමාගම/ආයතනය/ව්‍යාපාරය විසින් නිරත වනු ලබන යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන්, මා/අප හෝ එවැනි බැංකු ගිණුමක බලය ලත් අත්සන්කරු/අත්සන්කරුවන් විසින් මින් මතු විටින් විට බැංකුව වෙත ලිඛිතව දැනුම් දෙනු ලබන විද්‍යුත් තැපැල් ලිපින මාර්ගයෙන්, බැංකුව මා/අප වෙත විද්‍යුත් බැංකු ප්‍රකාශ සහ/හෝ විද්‍යුත් බැංකු උපදෙස් සම්පාදනය කළ යුතු යැයි මම/අපි මෙයින් ඉල්ලා සිටින අතර ඒ සඳහා බලය පවරමි/පවරමු.

2. විද්‍යුත් තැපෑල වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලියේ ස්වභාවය නිසා එසේ දැනුම් දීම දෝෂ වලින් සහ/හෝ බාධා වලින් තොර වනු ඇතැයි සහතික කළ නොහැකි බවට මා/අප අවබෝධයෙන් යුතුව එකඟ වන අතර, එවැනි දෝෂ සහ/හෝ බාධා ඇති වුව හොත් හෝ එහි ප්‍රතිඵලයක් ලෙස යම් විද්‍යුත් ප්‍රකාශයක්/විද්‍යුත් උපදෙසක් මා/අප වෙත එවීම පමා වුව හොත් සහ/හෝ එවිය නොහැකි වුව හොත් බැංකුව ඒ සම්බන්ධයෙන් මා/අප හට වගකීමට නීතියෙන් හෝ අන්‍යාකාරයකින් බැඳී නැති බවට මම/අපි අවබෝධයෙන් යුතුව එකඟ වෙමි/වෙමු. මා/අප වෙත ලැබෙන විද්‍යුත් ප්‍රකාශවල සහ/හෝ විද්‍යුත් උපදෙස්වල යම් දෝෂයක් වෙතොත් මම/අප ඒ බව බැංකුව වෙත **දැනුම් දෙමි/දෙමු**. මා/අප යොදා ගන්නා සේවා සම්පාදකයන් සිය ප්‍රතිපත්තිවල යම් වෙනසක් සිදු කළ හොත් බැංකුව ඒ සඳහා වගකීමට නීතියෙන් බැඳී නැති බවට ද මම/අපි එකඟ වෙමි/වෙමු.

3. මා/අප විසින් අනුමත කෙරී ඇති විද්‍යුත් තැපැල් ලිපිනයන් වෙත යම් තුන් වන පාර්ශ්වයක්/පාර්ශ්වකරුවන් විසින් අවසරයකින් තොරව ප්‍රවේශ වනු ලැබීමට සහ/හෝ භාවිත කරනු ලැබීමට මා/අප විසින් අවසර හෝ ඉඩ නො දිය යුතු බවටත්, මා/අප විසින් අනුමත කෙරී ඇති විද්‍යුත් තැපැල් ලිපිනයන් සහ/හෝ මා/අප විසින් අනුමත කෙරී ඇති විද්‍යුත් තැපැල් ලිපිනයන් මාර්ගයෙන් මා/අප වෙත එවනු ලබන යම් විද්‍යුත් ප්‍රකාශයක සහ/හෝ විද්‍යුත් උපදෙසක අඩංගු යම් තොරතුරක් අනවසරයෙන් ලබා ගැනීම සහ/හෝ භාවිතා කිරීම **ඇතුළු** යම් අනවසර ප්‍රවේශයක් සිදු වුව හොත් බැංකුව ඒ සම්බන්ධයෙන් මා/අප හට වගකීමට නීතියෙන් හෝ අන්‍යාකාරයකින් බැඳී නැති බවටත් මම/අපි ප්‍රතිඥා දී එකඟ වෙමි/වෙමු.

4. මා/අප විසින් ඉල්ලුම් කර ලබා ගන්නා ලද මුර පදය හෝ මුර පද සහ/හෝ බැංකුව විසින් මා/අප හෝ බලය ලත් අත්සන්කරු/අත්සන්කරුවන් වෙත පවරා දෙන ලද හෝ බැංකුවේ අවසරය මත මා/අප හෝ බලය ලත් අත්සන්කරු/අත්සන්කරුවන් විසින් උපදවා ගන්නා ලද පෞද්ගලික හැඳුනුම් අංකවල ("PIN අංකවල") රහස්‍ය භාවය පූර්ණ ලෙස ආරක්ෂා කරන බවටත්, එවැනි මුර පද සහ/හෝ PIN අංක බලය නොලත් කිසිදු තුන් වන පාර්ශ්වයකට අනාවරණය නොකරන බවටත් මම/අපි ප්‍රතිඥා දී එකඟ වෙමි/වෙමු. යම් තුන් වන පාර්ශ්වයක් එවැනි මුර පද සහ/හෝ PIN අංක වෙත අනවසරයෙන් ප්‍රවේශ වීමක් හෝ භාවිත කිරීමක් සිදු වුව හොත් නීතියෙන් හෝ අන්‍යාකාරයකින් වගකීමට බැඳී සිටින්නේ මා/අප පමණක් බවට මම/අපි පිළිගෙන එකඟ වෙමි/වෙමු.

5. යම් විද්‍යුත් ප්‍රකාශයක් සහ/හෝ විද්‍යුත් උපදෙසක් මා/අප වෙත නො ලැබුණ හොත් මා/අප හෝ බලය ලත් අත්සන්කරු/අත්සන්කරුවන් විසින් ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු බවටත්, බැංකුවට සිය අභිමතය පරිදි එම විද්‍යුත් ප්‍රකාශ හෝ විද්‍යුත් උපදෙස් නැවතත් මා/අප වෙත එවිය හැකි බවටත් මම/අපි එකඟ වී ප්‍රතිඥා දෙමි/දෙමු. කෙසේ වුව ද, බැංකුව විසින් විද්‍යුත් ප්‍රකාශවල සහ විද්‍යුත් උපදෙස්වල කඩදාසි පිටපත් සම්පාදනය කරනු ඇත්තේ විශේෂ ඉල්ලීමක් මත සහ අදාළ ගාස්තු ගෙවූ විට පමණක් බවට මම/අපි අවබෝධයෙන් යුතුව එකඟ වෙමි/වෙමු.

6. යම් විද්‍යුත් ප්‍රකාශයක් සහ/හෝ විද්‍යුත් උපදෙසක් ලැබීමේ දී යම් පමාවක් සිදු වීම හෝ නොලැබීම කරණ කොට ගෙන මා /අප විසින් යම් නියමිත දිනකට පෙර බැංකුව සහ/හෝ වෙන යම් පාර්ශ්වයක් වෙත යම් ගෙවීමක් කිරීමට ඇති යම් නීතිමය බැඳීමකින් හෝ වෙන යම් ක්‍රියාවක් හෝ කාර්යයක් කිරීමට හෝ ඉටු කිරීමට තිබෙන යම් නීතිමය බැඳීමකින් මා/අප නිදහස් නොවන බවට මම/අපි අවබෝධයෙන් යුතුව එකඟ වෙමි/වෙමු.

7. මා/අප වෙත යම් විද්‍යුත් ප්‍රකාශයක් සහ/හෝ විද්‍යුත් උපදෙසක් ලැබීමේ දී පමාවක් සිදු වීම සහ/හෝ නොලැබීම නිසා ද ඇතුළුව බැංකුව මෙම විද්‍යුත් ප්‍රකාශය සහ/හෝ විද්‍යුත් උපදෙස මා/අප වෙත සම්පාදනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මා/අප හට යම් අලාභයක් සහ/හෝ පාඩුවක් විඳීමට හෝ දැරීමට සිදු වුව හොත් ඒ සම්බන්ධයෙන් බැංකුව මා/අප හට නීතියෙන් සහ/හෝ අන්‍යාකාරයකින් වගකීමට බැඳී නැති බවට මම/අපි අවබෝධයෙන් යුතුව එකඟ වෙමි/වෙමු.

8. විද්‍යුත් ප්‍රකාශය සහ/හෝ විද්‍යුත් උපදෙස මා/අප වෙත සම්පාදනය කිරීම සඳහා දැරීමට සිදු වන හෝ දැරීමට සිදු විය හැකි සියලු මුදල්, ගාස්තු, අය කිරීම් හා වියදම් අවශ්‍ය අවස්ථාවල දී බැංකුව වෙත ගෙවීමට මම/අපි කැමැත්ත දී එකඟ වෙමි/වෙමු. එමෙන් ම, මා/අප විසින් බැංකුවේ පවත්වා ගෙන යනු ලබන යම් ගිණුමකින් (ගිණුම් වලින්) හර (අඩු) කර ගෙන එවැනි ගෙවීම් පියවා ගැනීමට මෙම ලියවිල්ලෙන් බැංකුවට අහෝසි කළ නොහැකි බලයක් පැවරේ.

9. බැංකුව විසින් මා/අප වෙත විද්‍යුත් ප්‍රකාශය සහ/හෝ විද්‍යුත් උපදෙස සම්පාදනය කරනු ලැබීමට හිලව් වශයෙන් බැංකුව මා/අප වෙත විද්‍යුත් ප්‍රකාශ සහ/හෝ විද්‍යුත් උපදෙස් සේවාව සම්පාදනය කිරීම සහ/හෝ ඒ අනුව එම ප්‍රකාශ සහ/හෝ උපදෙස් මා/අප වෙත එවීම කරණ කොට ගෙන හෝ එවීමට සම්බන්ධිතව ඍජුව හෝ වක්‍රව බැංකුවට මුහුණ පෑමට සිදු විය හැකි හෝ බැංකුවට විඳීමට හෝ දැරීමට සිදු විය හැකි සියලු ක්‍රියා, පටිපාටිකර, හිමිකම්, අලාභ, පාඩු, පිරිවැයවල් හා වියදම් වලින් හැම විට ම බැංකුව නිදහස් කිරීමටත් බැංකුව හානි වලින් ආරක්ෂා කිරීමටත් මම/අපි ප්‍රතිඥා දෙමි/දෙමු.

10. මා/අප මෙම සේවාව ලබා ගැනීම අවසන් කිරීමට අදහස් කරන්නේ නම් මා/අප හෝ බලය ලත් අත්සන්කරු/අත්සන්කරුවන් විසින් බැංකුව වෙත අවසන් කිරීමේ ලිඛිත නිවේදනයක් ලබා දිය යුතු බවටත්, කෙසේ වුව ද බැංකුව වෙත සැබවින් ම එම නිවේදනය

සහ එම නිවේදනය සම්බන්ධයෙන් ක්‍රියා කර මෙම සේවාව අවසන් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් (**යටත් පිරිසෙයින්** එවැනි නිවේදනයක් ලැබීමෙන් පසු දින 21ක්) නො ලැබුණ හොත් හා ලැබෙන තෙක් මෙම ලියවිල්ලෙහි අඩංගු වන හා විටින් විට සංශෝධනය කෙරෙන නියමයන් හා කොන්දේසිවල බලය හා බලපෑම පූර්ණ ලෙස හා අඛණ්ඩව පවතින බවටත් මම/අපි කැමැත්ත දී එකඟ වෙමි/වෙමු. කෙසේ වුව ද, එවැනි අවසන් කිරීමක් කරණ කොට ගෙන එම අවසන් කිරීම බලාත්මක වන දිනට පෙර මෙම නියමයන් හා කොන්දේසි යටතේ දැරීමට සිදු වන යම් නීතිමය සහ/හෝ අන්‍යාකාර බැඳීමකින් මා/අප නිදහස් නොවනු ඇත.

11. මා/අප වෙත දැනුම් දීමකින් තොරව සහ කිසිදු හේතුවක් නො දක්වා සිය තනි හා පරම අභිමතය මත මෙම සේවාව ලබා නො දී සිටීමට, අත්හිටුවීමට, අවලංගු කිරීමට, නතර කිරීමට හෝ අවසන් කිරීමට බැංකුවට හිමිකම තිබෙනු ඇත. සිය **අභිමතය** මත විද්‍යුත් ප්‍රකාශ/විද්‍යුත් උපදෙස් යවන නිරන්තරතාව වෙනස් කිරීමට සහ විද්‍යුත් ප්‍රකාශය/විද්‍යුත් උපදෙස සකස් කෙරෙන දිනය වෙනස් කිරීමට සහ බැංකුවේ **අභිමතය** මත විටින් විට වෙනස් කර විද්‍යුත් ප්‍රකාශය/විද්‍යුත් උපදෙස **බැංකුව** තීරණය කරන ආකෘතියකින් ඉදිරිපත් කිරීමට ද බැංකුවට හිමිකම තිබෙනු ඇත.

12. මා/අප විසින් දැන් හෝ මින් මතු පවත්වා ගෙන යනු ලබන යම් ගිණුමකට අදාළව විද්‍යුත් ප්‍රකාශ/විද්‍යුත් උපදෙස් එවන ලද පසු කඩදාසි බැංකු ප්‍රකාශ/උපදෙස් නොඑවනු ලබන බවට මම/අපි එකඟ වෙමි/වෙමු. ඕනෑ ම මොහොතක කඩදාසි බැංකු ප්‍රකාශ/උපදෙස් යැවීම නතර කිරීමට බැංකුවට පවත්නා අයිතියට හානියක් කර නො ගෙන සිය අභිමතය මත විද්‍යුත් ප්‍රකාශ සහ/හෝ විද්‍යුත් උපදෙස් සේවාවට අමතරව මා/අප වෙත එවැනි කඩදාසි බැංකු ප්‍රකාශ/උපදෙස් සම්පාදනය කිරීමට බැංකුව විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

13. සිය පරම අභිමතය මත ඕනෑ ම මොහොතක මෙම නියමයන් හා කොන්දේසි සංශෝධනය කිරීමට, ඌනපූරණය කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුවට හිමිකම තිබෙනු ඇති බවටත් එම සංශෝධනය, ඌනපූරණය හෝ වෙනස අනුව කටයුතු කිරීමට මා/අප බැඳී සිටිය යුතු බවටත් මම/අපි කැමැත්ත දී එකඟ වෙමි/වෙමු.

14. විද්‍යුත් ප්‍රකාශය හෝ විද්‍යුත් උපදෙස තුළ අන්තර්ගත කොට හෝ ඒ සමග හෝ භාෂා තුනෙන් ම යම් පුවත්පතක පළ කර හෝ බැංකුවේ ශාඛාවල තිබෙන යම් දැන්වීම් පුවරුවක ප්‍රසිද්ධ කර හෝ වෙන යම් ආකාරයකින් කරුණු විස්තර කිරීමක ස්වරූපයෙන් බැංකුව විසින් මා/අප වෙත යම් නිවේදනයක් ලබා දෙනු ලැබිය හැකි බවට මම/අපි කැමැත්ත දී එකඟ වෙමි/වෙමු.

15. මා/අප වෙත එවීමට අදහස් නොකරන ලද විද්‍යුත් ප්‍රකාශයක්/විද්‍යුත් උපදෙසක් මා/අප වෙත ලැබුණ හොත් එම විද්‍යුත් තැපැල ලද විගස එය බැංකු පද්ධතියට අදාළ ඇමතුම් ස්ථානය වෙත ආපසු හරවා යවන/දැනුම් දෙන බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

16. **යම් පැහැදිලි කිරීමක් කර ගැනීමට අවශ්‍ය නම්** මා/අප හට **2350000 දුරකථන අංකයෙන් බැංකුවේ** ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය හැකි බව මම/අපි පිළිගනිමි/පිළිගනිමු.

17. **විද්‍යුත් ප්‍රකාශ/විද්‍යුත් උපදෙස්** තුළ කිසි යම් අලෙවිකරණ තොරතුරු ඇතුළත් කිරීමට බැංකුවට අයිතිය තිබෙන බව මම/අපි පිළිගනිමි/පිළිගනිමු.

18. බැංකුව **විද්‍යුත් ප්‍රකාශය/විද්‍යුත් උපදෙස** එවන විද්‍යුත් තැපැල් ලිපිනය මා/අප විසින් බැංකුව සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාවිතා නො කළ යුතු බවටත්, බැංකුව මා/අප වෙතින් ලැබෙන එවැනි විද්‍යුත් තැපැල් වලට ප්‍රතිචාර නොදක්වනු ඇති බවටත් මම/අපි පිළිගෙන එකඟ වෙමි/වෙමු.

19. බැංකුවට සිය **අභිමතය** මත **විද්‍යුත් ප්‍රකාශ**/විද්‍යුත් උපදෙස් පහසුකම පිරිනැමෙන ගිණුම තීරණය කළ හැකි බව මම/අපි පිළිගනිමි/පිළිගනිමු. ගිණුම බද්ධ ගිණුමක් නම් උක්ත **විද්‍යුත් ප්‍රකාශය**/විද්‍යුත් උපදෙස ප්‍රධාන ගිණුම් **හිමියා** වෙත ලැබෙනු ඇත. කෙසේ වුව ද, **බද්ධ** ගිණුම් හිමියන් **දෙදෙනා ම බැංකුවට** වගකීමට නීතියෙන් බැඳී සිටිය යුතු ය.

20. මා/අප මෙන් ම මාගේ/අපගේ අනුප්‍රාප්තිකයන්, උරුමක්කාරයන්, පොල්මඃකාරයන්, පරිපාලකයන් හෝ අවසර ලත් පැවරුම්ලාභීන් ද මෙම ලියවිල්ලෙහි අඩංගු වන නියමයන් හා කොන්දේසි වලට බැඳී සිටිය යුතු ය.

21. මෙම අයදුම් පත ලියා අත්සන් කෙරෙන්නේ සමාගමක් විසින් හෝ වෙනුවෙන් නො වේ නම් **මෙම ලියවිල්ලේ නියමයන් හා කොන්දේසි යටතේ** මා/අප හට බැංකුව වෙත පවත්නා බැඳීම සන්ධිය හා ස්වාධීන විය යුතු ය.

22. මෙම නියමයන් හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති වලට අනුකූලව අර්ථ නිරූපණය කළ යුතු අතර එම නීති විසින් පාලනය විය යුතු ය.

'ගිණුම' යන වචනයෙන් අදහස් වන්නේ ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම්, ණය, කල් බදු, ස්ථාවර තැන්පතු, ක්‍රෙඩිට් කාඩ් (ණයවර පත්) ය.

'මම, අපි, මා, අප, අපගේ' යන වචනවලින් අදහස් වන්නේ හා ඒවාට ඇතුළත් වන්නේ පුද්ගලයන්, සමාජයන් (clubs), සංගම්, **හිමිකම්**, හවුල්කාරිත්වයන් හා 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ ස්ථාපිත සමාගම් ය.

මෙම ලියවිල්ලට අත්සන් කිරීමට පෙර ඉහත නියමයන් හා කොන්දේසි ද විද්‍යුත් ප්‍රකාශ හා විද්‍යුත් උපදෙස් සේවාව පිළිබඳ තොරතුරු ද මා/අප හට ලබා දෙන ලද හා පැහැදිලි කර දෙන ලද බවත්, මා/අප උක්ත තොරතුරු හා නියමයන් හා කොන්දේසි කියවා බැලූ බව සහ/හෝ අවබෝධ කර ගත් බවත්, ඒවායින් බැඳී සිටීමට එකඟ හා කැමති බවත් මම/අපි මෙයින් සහතික කර සිටිමි/සිටිමු.